# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2055/31 - 2018 ජනවාරි මස 24 වැනි බදාදා - 2018.01.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

එල්. ඩී. බී. 21/1978(x)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන සහ මහාමාර්ග අමාත්‍ය ලක්ෂ්මන් කිරිඇල්ල වන මා විසින්, 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කොට ඇති සමාගමක් වන ලියාපදිංචි අංක ජී. එල්. 24 දරන ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් ඉන්ෆොමේෂන් ටෙක්නොලොජි (ගැරන්ටි) ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන් ඉහත කී විශ්වවිද්‍යාල පනතේ 70 ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසු, මෙම නියමය මගින්, එකී පනත යටතේ සාදනු ලැබූ 2016 පෙබරවාරි මස 25 වැනි දින අංක 1955/20 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමයේ II වන උපලේඛනයේ I වන තීරයේ දැක්වෙන "ද්‍රව්‍ය ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධිය" යන සටහනට හා එහි II වන තීරයේ අනුරූප සටහනට ඉක්බිතිව ම මෙහි II වන උපලේඛනයේ පිළිවෙළින් I වන සහ II වන තීරයන්හි නිශ්චිතව සඳහන් සටහන් මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් කොන්දේසිවලට යටත්ව එකතු කිරීම මගින් එම නියමයේ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**I වන උපලේඛනය**

***කොන්දේසි***

ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් ඉන්ෆොමේෂන් ටෙක්නොලොජි (ගැරන්ටි) ලිමිටඩ් ආයතනය විසින්, මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් උපාධි වැඩසටහන් සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේ දී -

(අ) ව්‍යාපාර කළමනාකරණපති උපාධිය සම්බන්ධයෙන් මෙහි පහත දක්වා ඇති පරිදි ශ්‍රී ලංකා යෝග්‍යතාවල ක්ෂේත්‍රයෙහි (SLQF) නියම කොට ඇති ආකාරයෙන් -

(i) අදාළ විෂය ක්ෂෙත්‍රයෙන් අධ්‍යයන සම්භාර 30 ක් ඇතුළත්ව ප්‍රථම උපාධියක්, හෝ
(ii) අදාළ විෂය ක්ෂෙත්‍රයෙන් SLQF 06 හෝ ඊට ඉහළ ස්ථරයක යෝග්‍යතාවක්

යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකමට අනුකූල විය යුතු අතර යෝග්‍යතා නාමයට වෙනත් යෝග්‍යතා ක්ෂේත්‍රයන් සම්බන්ධ කරනු නොලැබිය යුතු ය.

(ආ) භෞතීය විද්‍යා පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව උපාධිය සම්බන්ධයෙන්, අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් සංයුක්ත ගණිතය හෝ උසස් ගණිතය, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය සහ ගණිතය යන විෂයයන් අතරින් එකවර ''S'' සමාර්ථ තුනක් (03) ලබා තිබීම යන අවම ඇතුළත් කරගැනීමේ සුදුසුකම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම යන්නට අනුකූල විය යුතු ය.

**II වන උපලේඛනය**

| *I වන තීරය*<br>*උපාධිය* | *II වන තීරය*<br>*උපාධිය සඳහා වන කෙටි යෙදුම* |
|---|---|
| ව්‍යාපාර කළමනාකරණපති | එම්බීඒ |
| භෞතීය විද්‍යා පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව | බීඊඩී ගෞරව (භෞතීයවිද්‍යා) |

ලක්ෂ්මන් කිරිඇල්ල,
උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය.

2018 ජනවාරි මස 24 වැනි දින,
කොළඹ දී ය.

02 - 313

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.